රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය
அரசாங்க நிருவாகச் சுற்றறிக்கை
**Public Administration Circular**

අංකය
இல.
No. } 35 √

# නව ප්‍රවේශකයන් සහ රාජ්‍ය භාෂාව—සේවා කොන්දේසි

## புதிதாகச் சேர்ந்தவர்களும் அரசகரும மொழியும்—சேவை நிபந்தனைகள்

## New-Entrants and the Official Language—Conditions of Service

ආයතන චක්‍රලේඛ මාලා අංකය
தாபனத் தொடர் இல.
Establishments Series No. } 27

රජයේ මුද්‍රණාලයේ මුද්‍රිතයි

මිළ ගණන Price : –/30     තැපැල් ගාස්තුව தபாற் செலவு Postage : –/10

# නව ප්‍රවේශකයන් සහ රාජ්‍ය භාෂාව—සේවා කොන්දේසි

**1. මෙම චක්‍රලේඛයේ දිනයට පෙර, නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වී ඇති අය**

1 : 1 1966 සැප්තැම්බර් මස 4 වැනි දින අංක 701 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය කෙරෙහි ද 1969 මාර්තු මස 22 වැනි දින අංක "ජී" 214, 1969 දෙසැම්බර් මස 15 වැනි දින අංක "ජී" 234 සහ 1970 මැයි මස 25 වැනි දින අංක "ජී" 244 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපි කෙරෙහිද සැලකිල්ල යොමු කරන මෙන් ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධයෙන් රජය විසින් පහත සඳහන් තීරණවලට එළඹී ඇත.

1 : 2 නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වී සිටින නමුත්, ඉඩ දී ඇති කාල සීමාව ඇතුළත දී සිංහල පිළිබඳ ප්‍රවීණතාව ලබාගැනීමට අපොහොසත්වීමේ හුදු හේතුව පිට ස්වකීය තනතුරුවල ස්ථිර කර නැති නව ප්‍රවේශක නිලධාරීන් එකී නියමිත පරීක්ෂණවලින් සමත් වී තිබෙන්නේ මෙම චක්‍රලේඛයේ දින දී හෝ ඊට කලින් නම් ඔවුන් දැන් සිය තනතුරුවල ස්ථිර කළ යුතුය.

1 : 3 එසේ ස්ථිර කළ යුත්තේ, ස්ථිර කරනු ලැබීම සඳහා අවශ්‍ය අනිත් සියලුම කරුණුද සපුරා ඇතොත් පමණකි.

1 : 4 අංක "ජී" 214, අංක "ජී" 234 හෝ අංක "ජී" 244 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපි යටතේ තනතුරෙහි ස්ථිර කරනු ලැබුවාවූ හෝ මෙම චක්‍රලේඛයේ 1 : 2 වැනි උප වගන්තිය යටතේ දැන් ස්ථිර කරනු ලබන්නාවූ හෝ නිලධාරියකුගේ පරිවාස/පරීක්ෂණ කාලය, ඔහුට නියම කර ඇති ඉහළම පරීක්ෂණයෙන් ඔහු සමත් වූ දිනය දක්වා 121 වැනි පරිපාලන රෙගුලාසියේ (2) වැනි අතුරු විධානය යටතේ **(වැටුප් වර්ධක විලම්බනය කරමින් නොව වැටුප් වර්ධක නවත්වමින්)** දීර්ඝ කරනු ලද්දක් සේ සැලකිය යුතුය.

1 : 5 යම් නිලධාරියකු නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වීමට අපොහොසත්වීම හේතුකොටගෙන නවත්වනු ලැබූ වැටුප් වර්ධක උපයා ගැනීමට අවශ්‍ය අනික් කරුණු ඔහු විසින් සම්පූර්ණ කොට ඇත්නම්, ඒ නිලධාරියා නියමිත ඉහළම පරීක්ෂණයෙන් සමත් වූ දින සිට, ඒ වැටුප් වර්ධක යථාවත් කළ යුතුය. (නවත්වනු ලැබූ වැටුප් වර්ධක යථාවත් කිරීම යනුවෙන් අදහස් කරන්නේ වැටුප් වර්ධක නවත්වනු නොලැබ සිරිත් පරිදි ගෙවාගෙන එන ලද්දේ නම් යථෝක්ත පරීක්ෂණය සමත් වූ දිනයේ දී ඒ නිලධාරියාට ලැබිය යුතුව තිබුණු වැටුප් තලයෙහි ඔහු පිහිටුවාලීම මිස ඒ දිනයට කලින් වූ කිසිම කාලයක් වෙනුවෙන් ඔහුට නොගෙවූ හිඟ වැටුප් වර්ධක මුදල් ඔහුට ගෙවීම නොවේ).

1 : 6 මෙම නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාව තීරණය කරනු ලබන්නේ 1969 සැප්තැම්බර් මස 6 වැනි දින අංක 769 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ දක්වා ඇති පදනම අනුවය.

1—කේ 4980 10,000 (71/7)

**2. ස්වකීය සාමාන්‍ය පරිවාස/පරීක්ෂණ කාලය අවසන්කර ඇත්තාවූද සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලට පෙනී සිටි නමුත් ඒවායින් සමත්වීමට අපොහොසත්වී ඇත්තාවූ ද අය**

2 : 1 ස්වකීය සාමාන්‍ය පරිවාස/පරීක්ෂණ කාලය අවසන් වී ඇත්තාවූත් නියමිත සියලුම සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් මෙම චක්‍රලේඛයෙහි දිනය වන විට සමත් වී නැති නමුත් ඒ පරීක්ෂණවලින් කවර පරීක්ෂණයකට වුවද පෙනී සිටියාවූත් නව ප්‍රවේශක නිලධාරීන් එම පරීක්ෂණවලින්, සමත්වීමට අපොහොසත් වීම ගැන නිදහසට කරුණු ඉදිරිපත් කළ යුතු බව මෙම චක්‍රලේඛයේ දින සිට මාස දෙකක් ඇතුළත දී දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් එම නිලධාරීන්ට නියම කළ යුතුය.

2 : 2 නිලධාරීන් විසින් මාසයක් ඇතුළත දී සිය නිදහසට කරුණු ඉදිරිපත් කළ යුතුය. තමන් පෙනී සිටි පරීක්ෂණවල සම්පූර්ණ විස්තර එනම් තමන් පෙනී සිටි ශ්‍රේණි, පරීක්ෂණ පැවැත්වූ දින, ලබාගත් ප්‍රතිඵල ආදියත් ස්වකීය නිදහසට කරුණු දක්වමින් ඉදිරිපත් කරන ලිපියෙහි සඳහන් කළ යුතුය.

2 : 3 නිලධාරීන් තම නිදහසට කරුණු දක්වමින් ඉදිරිපත් කරන ලිපි ලැබුණු වහාම දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් ඒවා රාජ්‍ය සේවා කොමිසම වෙත ඉදිරිපත් කොට එම නිලධාරීන්ගේ පරිවාස/පරීක්ෂණ කාලය 121 වැනි පරිපාලන රෙගුලාසිය යටතේ දීර්ඝ කළ යුතු ද එසේ නැතහොත් ඔවුන්ගේ පරිවාසික/පරීක්ෂණාත්මක පත්වීම් අවසන් කළ යුතු ද යන්න පිළිබඳ ව රාජ්‍ය සේවා කොමිසමෙන් නියෝගයක් ලබා ගත යුතුය.

**3. ස්වකීය සාමාන්‍ය පරිවාස/පරීක්ෂණ කාලය අවසන් කර ඇති නමුත් කිසිම සිංහල ප්‍රවීණතා පරීක්ෂණයකට පෙනී නොසිටි අය**

3 : 1 ස්වකීය සාමාන්‍ය පරිවාස/පරීක්ෂණ කාලය ඉකුත් වී ඇති නමුත්, මෙම චක්‍රලේඛයේ දිනය වන තෙක් කිසිදු සිංහල ප්‍රවීණතා පරීක්ෂණයකට පෙනී නොසිටි අයට වහාම ලිත් මාසයක දැන්වීමක් කොට ඔවුන්ගේ පරිවාසික/පරීක්ෂණාත්මක පත්වීම් අවසන් කළ යුතුය.

3 : 2 තම පත්වීම් අවසන් කිරීමට විරුද්ධව ඇපෑලක් ස්වකීය පත්වීම් අවසන් කිරීම පිළිබඳ දැන්වීම ලැබුණු දින සිට මාසයක් ඇතුළත දී, රාජ්‍ය සේවා කොමිසම වෙත ඉදිරිපත් කිරීමට එම නිලධාරීන්ට පුළුවන. ඔවුන්ගේ ඇපෑල් ඉදිරිපත් කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානයන්/පත්කිරීමේ බලධාරීන් මගිනි. එකී දෙපාර්තමේන්තු ප්‍රධානයන්/පත්කිරීමේ බලධාරීන් විසින් ස්වකීය නිරීක්ෂණ ද සමග එම ඇපෑල් රාජ්‍ය සේවා කොමිසම වෙත අප්‍රමාදව ඉදිරිපත් කළ යුතුය. අදාළ නිලධාරීන් විසින් සිය ඇපෑලේ පිටපතක් රාජ්‍ය සේවා කොමිසමේ ලේකම් වෙත කෙලින්ම යැවිය යුතුය.

3 : 3 ඉහත නියම කර ඇති කාලසීමාවෙන් පසුව ඉදිරිපත් කෙරෙන කිසිම ඇපෑලක් ගැන සලකා බලනු නොලැබේ.

### 4. ස්වකීය පරිවාස/පරීක්ෂණ කාලය තවමත් අවසන් කර නැති අය

4 : 1 ස්වකීය සාමාන්‍ය පරිවාස/පරීක්ෂණ කාලය තවමත් අවසන් කර නැත්තා වූත් එසේම නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණ අතුරින් කිසිවකටත් එකී පරිවාස/පරීක්ෂණ කාලය ඉකුත්වන දිනය වන විට පෙනී නොසිටියා වූත් නව ප්‍රවේශක නිලධාරීන්ට, එකී පරිවාස/පරීක්ෂණ කාලය අවසානයේදී ලිත් මාසයක දැන්වීමක් කොට ඔවුන්ගේ පාරිවාසික/පරීක්ෂණාත්මක පත්වීම් අවසන් කළ යුතුය.

4 : 2 තම පත්වීම් අවසන් කිරීමට විරුද්ධව ඇපෑලක්, ස්වකීය පත්වීම් අවසන් කිරීම පිළිබඳ දැන්වීම ලැබුණු දින සිට මාසයක් ඇතුළත දී, රාජ්‍ය සේවා කොමිසම වෙත ඉදිරිපත් කිරීමට එම නිලධාරීන්ට පුළුවන.

4 : 3 එබඳු ඇපැල් සම්බන්ධයෙන් ද 3 : 2 වැනි සහ 3 : 3 වැනි උප වගන්ති වල දක්වා ඇති ක්‍රියා මාර්ගය අනුගමනය කළ යුතුය.

4 : 4 මෙම චක්‍රලේඛයේ දිනයෙන් පසුව ස්වකීය සාමාන්‍ය පරිවාස/පරීක්ෂණ කාලය අවසන් වන්නාවූත් නියමිත සියලුම සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් එකී පරිවාස/පරීක්ෂණ කාලය ඉකුත්වන දිනය වන විට සමත් වී නැති නමුත් ඒවා අතුරින් කවර පරීක්ෂණයකට වුවද පෙනී සිටියාවූත් නිලධාරීන්ට, එම පරීක්ෂණ වලින් සමත්වීමට අපොහොසත්වීම ගැන සිය නිදහසට කරුණු ඉදිරිපත් කරන ලෙස ඔවුන්ගේ සාමාන්‍ය පරිවාස/පරීක්ෂණ කාලය අවසන් වූ වහාම නියම කළ යුතුය. එබඳු නිලධාරීන් විසින් සිය නිදහසට කරුණු මාසයක් ඇතුළත දී ඉදිරිපත් කළ යුතුය, තමන් පෙනී සිටි පරීක්ෂණවල ශ්‍රේණී, එම පරීක්ෂණ පැවැත්වූ දින, ලබාගත් ප්‍රතිඵල ආදී සියලුම විස්තර ඔවුන් සිය නිදහසට කරුණු දක්වමින් ඉදිරිපත් කරන ලිපියෙහි සඳහන් කළ යුතු ය.

4 : 5 මෙම නිලධාරීන් තම නිදහසට කරුණු දක්වමින් ඉදිරිපත් කරන ලිපි ලැබුණු වහාම ඒවා රාජ්‍ය සේවා කොමිසම වෙත ඉදිරිපත් කොට එම නිලධාරීන් ගේ පරිවාස/පරීක්ෂණ කාලය 121 වැනි පරිපාලන රෙගුලාසිය යටතේ දීර්ඝ කළ යුතු ද එසේ නැතහොත් ඔවුන්ගේ පාරිවාසික/පරීක්ෂණාත්මක පත්වීම් අවසන් කළ යුතු ද යන්න පිළිබඳව රාජ්‍ය සේවා කොමිසමෙන් නියෝගයක් ලබා ගත යුතුය.

4 : 6 මෙහි 4 : 4 වැනි උප වගන්තියේ සඳහන් ගණයට අයත් නිලධාරීන්ගේ පරිවාස/පරීක්ෂණ කාලය දීර්ඝ කිරීමෙහිලා දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් ස්වකීය අභිමතය පාවිච්චි නොකළ යුතුය.

### 5. වයස අවුරුදු 45 දී හෝ ඉන්පසුව රජයේ සේවයට බඳවා ගනු ලැබූ අය

5 : 1 සිය 45 වැනි උපන් දිනයේ දී හෝ ඉන්පසුව හෝ රජයේ සේවයට බඳවා ගනු ලැබුවාවූත් නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීමට අපොහොසත් වීමේ එකම හේතුව උඩ සිය තනතුරුවල සථිර කර නැත්තාවූත් නිලධාරීන් එකී

කොන්දේසිය සපුරාලීමට අපොහොසත් වී ඇතත්, විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ලැබීමට සුදුසුකම් වීමට ඔවුන්ට ඉඩ ලැබෙන පරිදි ඔවුන්ගේ සේවය අන්තිමේ දී අවසන් කරනු ලැබීමට ආසන්න පූර්වයෙන් ඔවුන් එම තනතුරුවල ස්ථිර කළ යුතුය. වැටුප් වර්ධකය උපයා ගැනීමට අවශ්‍ය අනික් කරුණු සම්පූර්ණ වී තිබේ නම් අත්හිටුවන ලද වැටුප් වර්ධක යථාවත් කළ යුතුය. (මෙයින් අදහස් කරනුයේ ඔවුන්ගේ වැටුප් වර්ධක අත්හිටුවාගනු නොලැබ ගෙවන ලද්දේ නම් ඔවුන්ට ලැබිය යුතුව තිබුණු වැටුප් තලයෙහි ඔවුන් පිහිටුවාලීම මිස හිඟ වැටුප් වර්ධක මුදල් කිසිවක් ඔවුන්ට ගෙවීම නොවේ).

**6. සාමාන්‍ය**

6 : 1 මෙම චක්‍රලේඛයේ කාර්යයන් සඳහා "පරීක්ෂණයකින් සමත් වන දිනය" විය යුත්තේ එම පරීක්ෂණය පැවැත්වූ දින යයි.

"නියමිත ප්‍රවීණතා පරීක්ෂණ" යනුවෙන් අදහස් වන්නේ 1966 සැප්තැම්බර් මස 4 වැනි දින අංක 701 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ දක්වා ඇති පරීක්ෂණයි.

6 : 2 මෙම චක්‍රලේඛය නිකුත් කෙරෙනුයේ රාජ්‍ය සේවා කොමිසමේ එකඟත්වය ද ඇතිව යි.

6 : 3 ස්වකීය අමාත්‍යාංශ යටතේ රජයේ සේවයෙහිත් සංස්ථාවල, මණ්ඩලවල සහ වෙනත් ආයතනවලත් නියුක්තව සිටින සියලුම නව ප්‍රවේශක නිලධාරීන්ට මෙම චක්‍රලේඛයෙහි අඩංගු කරුණු දන්වන ලෙස ස්ථිර ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

බී. මහාදේව

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
ටොරිංටන් චතුරශ්‍රය,
කොළඹ 7.
1971 ජූලි මස 9 වැනි දින දීය.
අංකය : 2/9/156/41 (එච්).